රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 22/2023

මගේ අංකය : EST-6/04/LON/0207
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2023.12.07

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**රජයේ නිලධරයන්ට විශේෂ අත්තිකාරම් - 2024 වසර**

2015.12.29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 26/2015 කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. එකී චක්‍රලේඛයේ 03 ඡේදයේ “2015 වර්ෂය” යන්න වෙනුවට “2023 වර්ෂය” යන්න ආදේශ කිරීමට සහ චක්‍රලේඛයේ “2016 වර්ෂය” ලෙස සඳහන්ව ඇති සෑම ස්ථානයකටම “2024 වර්ෂය” යන්න ආදේශ කිරීමට යටත්ව එකී චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව 2024 වර්ෂයට රු.4,000/-කට නොවැඩි වන විශේෂ අත්තිකාරම් මුදලක් ගෙවීමට රජය තීරණය කර ඇත.

03. මෙම අත්තිකාරම් ගෙවීම 2024.01.01 දිනෙන් ආරම්භ කර 2024.02.29 දිනෙන් අවසන් කළ යුතු වන අතර, 2024.02.29 දිනට පසු මෙම අත්තිකාරම් ගෙවීම නොකළ යුතු ය. මෙම අත්තිකාරම් මුදල 2024 වර්ෂය තුළදී ම අයකර අවසන් කළ යුතු ය.

04. මෙම චක්‍රලේඛය මහා භාණ්ඩාගාරයේ එකඟතාව ඇතිව නිකුත් කරන ලදී.

කේ.ඩී.එන්. රංජිත් අසෝක
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

දුරකථන : 0112-699399
ෆැක්ස් : 0112-692158
විද්‍යුත් ලිපිනය : ade-vi@pubad.gov.lk